# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1821/31 - 2013 ජූලි මස 31 වැනි බදාදා - 2013.07.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 24/51.

**(203 වන අධිකාරය වූ) මෝටර් රථ පනත**

මෝටර් රථ පනතේ 5 වන වගන්තියේ (2) වන උපවගන්තිය සහ 19 වන වගන්තිය සමග කියවිය යුතු (203 වන අධිකාරය වූ) එකී පනතේ 237 වන වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

කුමාර වෙල්ගම,<br>
ප්‍රවාහන අමාත්‍ය.

2013 ජූලි මස 25 වැනි දින,<br>
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2013 අංක 01 දරන මෝටර් රථ (මෝටර් ට්‍රයිසිකල්) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) පුද්ගලයන් හෝ භාණ්ඩ ප්‍රවාහනය සඳහා හෝ කුලී රථයක් ලෙස හෝ වෙනත් කාර්ය සඳහා මෝටර් ට්‍රයිසිකල යොදා ගනු ලබන එවැනි මෝටර් ට්‍රයිසිකලයක සෑම අයිතිකරුවකු විසින් ම යම් මගියකු විසින් ඇතුල්වීම හෝ පිටවීම වැළැක්වෙන පරිදි මෝටර් ට්‍රයිසිකලයේ මගී මැදිරියේ දකුණු පැත්තේ දොරටුව අර්ධ වශයෙන් හෝ ස්ථිර වශයෙන් වසා ඇති බවට සහතික විය යුතු ය.

(2) (අ) මෝටර් ට්‍රයිසිකලයක රියදුරකු විසින් මෝටර් ට්‍රයිසිකලයේ දකුණු පැත්තේ දොරටුවෙන් මෝටර් ට්‍රයිසිකලයට ඇතුල්වීම හෝ පිටවීම සඳහා කිසිම මගියකුට ඉඩ ලබා නොදිය යුතු ය.

(ආ) කිසිම තැනැත්තකු මෝටර් ට්‍රයිසිකලයේ දකුණු පැත්තේ දොරටුවෙන් මෝටර් ට්‍රයිසිකලයකට ඇතුල්වීම හෝ පිටවීම නොකළ යුතු ය.

(3) මෝටර් ට්‍රයිසිකලයක රියදුරකු විසින් 3 වන නියෝගය යටතේ අවසර දෙනු ලැබිය හැකි තැනැත්තන් සංඛ්‍යාවකට වඩා වැඩි සංඛ්‍යාවක් රැගෙන නොයා යුතු අතර, යම් මෝටර් ට්‍රයිසිකලයක රැගෙන යා හැකි තැනැත්තන් සංඛ්‍යාව මෝටර් ට්‍රයිසිකලයේ පිටුපස වම් පැත්තෙහි සංඛ්‍යාත්මකව සහ ප්‍රකටව පෙනෙන පරිදි ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

(4) (3) වන ඡේදයේ කාර්ය සඳහා මගීන් සංඛ්‍යාව ගණනය කිරීමේ කාර්ය සඳහා වයස අවුරුදු දොළහට අඩු ළමුන් දෙදෙනෙකු එක් මගියකු වශයෙන් ගණනය කරනු ලැබිය යුතුය.

1A - PG 001704 — 650 (2013/07)

මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

3. යම් මෝටර් ට්‍රයිසිකලයක අයිතිකරුවකු විසින් -

(අ) මෝටර් ට්‍රයිසිකලයක සියලු ආසන ආධාරකය මත ස්ථානගත කර සවිකර තිබිය යුතු අතර එක් එක් ආසනය ඔස්සේ සෘජු රේඛාවක් මගින් එක් එක් මගියා වෙනුවෙන් අවම වශයෙන් මිලිමීටර් 382 ක ඉඩ ප්‍රමාණයක් ලබා දිය යුතු බවට ;

(ආ) මෝටර් ට්‍රයිසිකලයක රියදුරු අසුනේ කෙළවර සහ ආසනයක ඉදිරි කෙළවර පසු කරන ස්ථානයේ ඇති සිරස් තලය අතර කෙටිම දුර ප්‍රමාණය මිලිමීටර් 230 කට අඩු නොවිය යුතු බවට ;

(ඇ) මෝටර් ට්‍රයිසිකලයක උස එහි පළලින් පොළව මට්ටමේ සිට සියයට එකසිය පනහක් නොඉක්මවිය යුතු බවට ;

(ඈ) යම් මෝටර් ට්‍රයිසිකලයකට පටවනු ලබන භාණ්ඩ ප්‍රමාණය මෝටර් ට්‍රයිසිකලයේ ඉදිරිපස කෙළවරේ හෝ පසුපස කෙළවරේ සිට පිටතට සෙන්ටිමීටර් 75 කට වැඩියෙන් දීර්ඝ නොවිය යුතු බවට ;

(ඉ) මෝටර් ට්‍රයිසිකලයකට සවිකර ඇති ආසනවල පිටඇන්ද අතර අවම පරතරය මිලිමීටර් 660 කට වඩා අඩු නොවිය යුතු බවට ; සහ

(ඊ) එක් එක් ආසනයට මුහුණලා ඇති ආසන මෝටර් ට්‍රයිසිකලයට සවි නොකළ යුතු බවට,

සහතික විය යුතු ය.

4. මෝටර් ට්‍රයිසිකලයක රියදුරු හැර වෙනත් කිසිම තැනැත්තකු රියදුරුගේ මැදිරියේ හෝ රියදුරු ආසනයේ රැගෙන නොයා යුතු ය.

5. මෝටර් ට්‍රයිසිකලය පැයට කි.මී. 40 ඉක්මවන වේගයකින් පදවාගෙන නොයා යුතු ය.

6. මෝටර් ට්‍රයිසිකලය මාර්ගයේ ගමන් කිරීමේ දී මෝටර් ට්‍රයිසිකලයේ අයිතිකරු හෝ රියදුරු විසින් වෙනත් කිසිම තැනැත්තකුට වෙළඳ දැන්වීම්, පත්‍රිකා හෝ අත් පත්‍රිකා බෙදා දීම සඳහා අවසර ලබා නොදිය යුතු ය.

7. ධාවනයේ යෙදී සිටින යම් මෝටර් ට්‍රයිසිකලයක රියදුරකු විසින් වෙනත් මාර්ග භාවිතකරුවන්ට බාධාවන හෝ පීඩාවන ආකාරයේ ශබ්දයක ඇති කරවන යම් උපකරණයක් හෝ උපාංගයක් භාවිත කිරීම හෝ භාවිත කිරීමට කටයුතු සැලැස්වීම නොකළ යුතු වේ. ශබ්දය මෝටර් ට්‍රයිසිකලය තුළට පමණක් සීමා වන බවත් එහි සිටින තැනැත්තන්ට පමණක් ඇසෙන පරිදි අදහස් කළ බවත් තහවුරු කිරීමට එම ශබ්දය පාලනය කළ යුතු ය.

8. (1) මෝටර් ට්‍රයිසිකලයක අයිතිකරු හෝ රියදුරු විසින් -

(අ) මෝටර් ට්‍රයිසිකලය පදවන ලබන රියදුරු විසින් සියලු අවස්ථාවල දී තමා විසින් පදවනු ලබන වේගය පැහැදිලිව දැකගැනීම සඳහා වේග මානය යථාපරිදි මෝටර් ට්‍රයිසිකලයට සවිකර ඇති බවට ;

(ආ) මෝටර් ට්‍රයිසිකලයේ ඉදිරිය බාධා රහිතව දර්ශනය කර ගැනීමට මෝටර් ට්‍රයිසිකලයේ රියදුරුට හැකිවන පරිදි විද්‍යුත් ලෙස හා විදුලියෙන් ක්‍රියාත්මක වන වාමුවා පිස්න සවිකර ඇති බවට ;

(ඇ) වායු ටයර සවිකර ඇති සෑම මෝටර් ට්‍රයිසිකලයක් ම එම මෝටර් ට්‍රයිසිකලය මාර්ග ධාවනයේ යෙදීමේදී එම මෝටර් ට්‍රයිසිකල රෝදයට හෝ ඇක්සලයට කඩිනමින් සවිකළ හැකි වන පරිදි යටත් පිරිසෙයින් එක් අමතර රෝදයක් සහ වෙනත් උපාංග රැගෙන යා යුතු බවට සහ විවිධ ප්‍රමාණයනගේ වායු ටයර සවිකර ඇති එවැනි සෑම මෝටර් ට්‍රයිසිකලයකම සුළං පුරවන ලද එක් එක් ප්‍රමාණයේ අතිරේක ටයර හෝ රැගෙන යා යුතු බවට ; සහ

(ඈ) රියදුරා හා මගීන් කාලගුණික තත්ත්වයන්ගෙන් ආරක්ෂා වීම සඳහා ආවරණ සවිකර ඇති බවට,

සහතික විය යුතු ය.

(2) පහත දැක්වෙන විද්‍යුත් උපාංග මෝටර් ට්‍රයිසිකලයට සවිකර ඇති බවට සහ ඒවා මනා තත්ත්වයෙන් පවතින බවට මෝටර් ට්‍රයිසිකලයේ අයිතිකරු විසින් සහතික විය යුතු ය. -

(අ) බාහිර පිටුපස දර්ශන කණ්ණාඩි දෙක ;

(ආ) ප්‍රධාන සහ අවපාත කළ හැකි දර්ශක පහන් සහිත ප්‍රධාන ලාම්පු ;

(ඇ) පසුපස නැවතුම් ලාම්පු ;

(ඈ) පැති දිසා පෙන්නුම් කිරීමේ ලාම්පු ;

(ඉ) ප්‍රතිවර්තන ලාම්පුව ;

(ඊ) රියදුරු මැදිරිය සහ මගී මැදිරිය සඳහා වූ අභ්‍යන්තර ලාම්පු දෙක ;

(උ) නවතා තැබීමේ ලාම්පු ; සහ

(ඌ) නලාව.

9. නොමිලේ හෝ යම් ගාස්තුවක් යටතේ පුද්ගලයන් හෝ භාණ්ඩ රැගෙන යාම සඳහා මෝටර් ට්‍රයිසිකලය භාවිත කරනු ලබන අවස්ථාවේදී -

(අ) මෝටර් රථ පනතේ 196 වන වගන්තියේ විධිවිධාන යටතේ යෝග්‍යතා සහතිකය නිකුත් කිරීම සඳහා පළමු ලියාපදිංචියේ සිට අවුරුදු දෙකක කාලයක් ගතවීමෙන් පසුව වාර්ෂිකව අයිතිකරු විසින් මෝටර් ට්‍රයිසිකලය පරීක්ෂා කරවා ගැනීමට කටයුතු සලස්වනු ලැබිය යුතු අතර, එකී සහතිකය නිකුත් කිරීම බලාත්මක වන දිනය කොමසාරිස් ජනරාල්වරයා විසින් ප්‍රකාශයට පත්කරනු ලැබිය යුතුය ;

(ආ) මගීන්ට පහසුවෙන් දැන ගැනීම සඳහා රියදුරු අසුන පිටුපස පහත දැක්වෙන තොරතුරු ප්‍රදර්ශනය කරනු ලැබිය යුතුය ;

(i) ලියාපදිංචි අංකය ;

(ii) රියදුරුගේ නම සහ රියදුරු බලපත්‍ර අංකය ;

(iii) රියදුරුගේ ඡායාරූපයක් (65" X 50" ප්‍රමාණයේ) ;

(iv) අධිකාරියේ සහ සංගමයේ හෝ සමිතියේ ලියාපදිංචි අංකය ;

(v) හදිසි අවස්ථාවක දී දැනුම් දීම සඳහා වූ දුරකථන අංක ;

(ඇ) මෝටර් ට්‍රයිසිකලයක රියදුරු විසින් ම තමා සේවයේ යෙදී සිටින සෑම අවස්ථාවක දීම -

(i) ශිෂ්ටසම්පන්න සහ විධිමත් ආකාරයට හැසිරිය යුතු ය ;

(ii) දුම්පානය නොකළ යුතු ය ;

(iii) තමා කුලී රථයක් ලෙස පාවිච්චි කිරීමෙන් නිදහස් කරනු ලබනතෙක් එම කාර්යය අවසන් නොකළ යුතු ය ; සහ

(iv) මගීන් විසින් අන්‍යාකාරයකින් ඉල්ලා සිටින්නේ නම් මිස, අඩුම කාලයක් තුළ හැකි කෙටිම මාර්ගය ඔස්සේ මගීන් ස්වකීය ගමනාන්ත කරා රැගෙන යා යුතු ය.

10. (1) යම් කුලී මෝටර් ට්‍රයිසිකලයක් භාවිතා කරනු ලබන සෑම මගියකු විසින් ම එම මෝටර් ට්‍රයිසිකලයේ රියදුරු විසින් ඉල්ලා සිටිනු ලැබුවේ නම් තමා විසින් යාමට අපේක්ෂිත ගමන පිළිබඳ ප්‍රකාශ කළ යුතු අතර, කුලී රථ මීටරයේ සඳහන් වී ඇති එම ගමන සඳහා වූ සම්පූර්ණ ගාස්තුව ඉල්ලා සිටීමේදී ගෙවනු ලැබිය යුතු ය.

(2) එම ගාස්තුව ගෙවීමෙන් පසුව, තත්කාර්ය සඳහා රිසිට්පතක් නිකුත් කිරීම එම මෝටර් ට්‍රයිසිකලයේ රියදුරාගේ වගකීම වන්නේ ය. එම රිසිට් පතෙහි අවශ්‍ය සියලු විස්තර අන්තර්ගත විය යුතු ය.

11. දණ්ඩ නීති සංග්‍රහය හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ දඬුවම් කළ හැකි යම් වරදක් සම්බන්ධයෙන් හෝ එවැනි වරදක් සිදු කිරීම සඳහා මෝටර් ට්‍රයිසිකලයක කිසිම රියදුරකු විසින් තමාගේ මෝටර් ට්‍රයිසිකලය භාවිතා කිරීම සඳහා අවසර ලබාදීම හෝ අවසර ලබාදීමට කටයුතු සැලැස්වීම නොකළ යුතු ය.

12. සෑම ගමනක් ම අවසන් කිරීමෙන් පසුව මගියකු විසින් යම් ද්‍රව්‍යයක් හදිසියේ තබා ගොස් ඇද්ද යන්න පිළිබඳව විමසා බැලීම සඳහා මෝටර් ට්‍රයිසිකලය පරීක්ෂා කර බැලිය යුතු ය. එවැනි යම් ද්‍රව්‍යයක් හමුවුනේ නම් සහ අයිතිකරු විසින් වහාම එය සොයා නොපැමිණියේ නම්, අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව රියදුරු විසින් එම ද්‍රව්‍ය ළඟම පිහිටි පොලිස් ස්ථානය වෙත රැගෙන ගොස් එම පොලිස් ස්ථානභාර නිලධරයා වෙත එම ද්‍රව්‍ය භාර දී එම ද්‍රව්‍ය ලැබුනු බවට එම පොලිසියෙන් රිසිට් පතක් ලබා ගත යුතු ය.

13. රියදුරුහට ප්‍රමාණවත් ඉඩක් පවතින පරිදි මෙන් ම ඔහුට පහසුවෙන් ළඟාවිය හැකි සහ ඉක්මණින් රථයේ පාලනය හැසිරවිය හැකි පරිදි සෑම මෝටර් ට්‍රයිසිකලයක් ම සැලසුම් කළ යුතු වේ. කාලගුණික කාරකවලින් ආරක්ෂා වීමටත් බාධා රහිතව මාර්ගය දර්ශනය කරගැනීමටත් හැකි වන පරිදි රියදුරුගේ ඉඩ පහසුකම සකස්කර ගනු ලැබිය යුතු ය.

14. (1) මෝටර් ට්‍රයිසිකලයක අයිතිකරුවකු විසින් එහි නිෂ්පාදක විසින් ඒ මත ලකුණු කරනු ලබන විස්තරාත්මක තොරතුරු හැර මෝටර් ට්‍රයිසිකලයේ ඉදිරිපස හෝ පසුපස අකුරු, ඉලක්කම් හෝ සංඛ්‍යා ලකුණු කර නොමැති බවට සහතික විය යුතු ය.

එසේ වුව ද, ගාස්තු සහ වෙනත් තොරතුරු මෝටර් ට්‍රයිසිකලයේ ඉදිරිපස හා පසුපස ලකුණු කරනු ලැබිය යුතු ය.

(2) දිසා දර්ශකය ඉහලින් මෝටර් ට්‍රයිසිකලයේ වම්පස ගාස්තු ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

(3) මෝටර් රථ පනතේ හෝ ඒ යටතේ සාදනු ලබන වෙනත් යම් නියෝගයක විධිවිධාන යටතේ හෝ සඳහන් කළ යුතු බවට නියමිත යම් තොරතුරු කොමසාරිස් ජනරාල්වරයා විසින් ලිඛිතව ලබාදුන් පූර්ව අනුමැතිය ඇතිව ලකුණු කරනු ලැබිය යුතු ය.

15. (1) පුද්ගලයන් හෝ භාණ්ඩ කුලියට ප්‍රවාහනය සඳහා හෝ වෙනත් කරුණක් සඳහා හෝ මෝටර් ට්‍රයිසිකලයක් භාවිතා කරනු ලබන සෑම අයිතිකරුවකු ම විසින් එම මෝටර් ට්‍රයිසිකලයේ කුලීරථ මීටරයක් සවිකරනු ලැබිය යුතු ය.

(2) මෝටර් ට්‍රයිසිකලයකට සවිකර ඇති යම් කුලීරථ මීටරයක් -

(අ) කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කර ඇති ප්‍රමිතියෙන් යුක්ත විය යුතු ය.

(ආ) පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ ඔහු විසින් බලයදුන් යම් නිලධරයකු විසින් පරීක්ෂා කර අනුමත කර තිබිය යුතු ය ; එනම්,

(i) බාහිර පෙනුම, සාමාන්‍ය ක්‍රියාකාරිත්වය සහ කාලය සහ දුර නිවැරදිව සඳහන් කරන්නේ ද යන්න අවබෝධ කර ගැනීමට ; සහ

(ii) මෙම නියෝගවල සඳහන් ප්‍රමිති අනුමැතියට අනුකූල වීම.

(3) මෝටර් ට්‍රයිසිකලයක සෑම අයිතිකරුවකු විසින් ම කුලීරථ මීටරය පරීක්ෂාකරවා ගැනීමට කටයුතු සලස්වනු ලැබිය යුතු අතර, තත්කාර්ය සඳහා නිකුත් කරනු ලබන රිසිට්පත මෝටර් ට්‍රයිසිකලයේ අලවා තිබිය යුතු ය.

(4) සෑම ආකාරයකින්ම කුලීරථ මීටරයක් පරීක්ෂා කිරීමෙන් පසුව, එහි අභ්‍යන්තර කොටස් වෙනස් කළ නොහැකි ලෙස හෝ මුද්‍රා කැඩීමෙන් තොරව ළඟාවිය නොහැකි ලෙස කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ යම් බලයලත් නිලධරයකු විසින් මුද්‍රා තබනු ලැබිය යුතු ය.

(5) මෝටර් ට්‍රයිසිකලයකට සවිකර ඇති සෑම කුලීරථ මීටරයක් ම යටත් පිරිසෙයින් සෑම මාස දොළහකට ම වරක් හෝ අලුත්වැඩියා සඳහා හෝ සකස් කිරීම් සඳහා මුද්‍රා ඉවත් කරනු ලබයි නම් ඊට පෙර හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ වෙනත් යම් බලයලත් නිලධරයකු විසින් පරීක්ෂා කරනු ලැබිය යුතු ය. කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් බලය ලබා දුන් යම් නිලධරයකු විසින් මිනුම් ක්‍රමාංක සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(6) කොමසාරිස් ජනරාල්වරයාගේ පූර්ව අනුමැතිය නොමැතිව කිසිම කාර්යයක් සඳහා මුද්‍රා ඉවත් කිරීම හෝ වෙනස් කිරීම නොකළ යුතු ය.

(7) මෝටර් ට්‍රයිසිකලයේ නිර්මාණය හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද වෙනත් යම් තත්ත්වයක් පිළිබඳ හෝ සැලකිල්ලට ගෙන, කුලීකරුට පැහැදිලිව දර්ශනය වන පරිදි මෙන් ම කුලීකරු සහ රියදුරුහට කියවා ගත හැකි වන පරිද්දෙන් මෝටර් ට්‍රයිසිකලයේ අභ්‍යන්තරය දෙසට සෑම කුලීරථ මීටරයක ම මුහුණත හෝ ඩයලය සවිකරනු ලැබිය යුතු ය.

(8) රාත්‍රී කාලයේ දී කුලීරථ මීටරය ප්‍රදර්ශනය වන පරිදි සෑම මෝටර් ට්‍රයිසිකලයක ම ලාම්පුවක් සවිකර තිබිය යුතු ය.

(9) යම් තැනැත්තකු විසින් කුලියට ලබාගත් මෝටර් ට්‍රයිසිකලයේ යම් දෝෂයක් නිසා ඉදිරියට ගමන් කිරීමට නොහැකි වන අවස්ථාවක දී, රියදුරු විසින් කුලීරථ මීටරය නවත්වා එය නවත්වා ඇති බව පෙන්වාදිය යුතු අතර, මගියාගේ කැමැත්ත ඇතිව ගමන නැවත ආරම්භ කරනු ලබන තෙක් කුලීරථ මීටරය නැවත ආරම්භ නොකළ යුතු ය.

(10) කුලීරථ මීටරය මගින් යම් මෝටර් ට්‍රයිසිකලයක් කුලී රථ සේවය සඳහා යෙදෙන බවට ප්‍රදර්ශනය කරනු ලබන අවස්ථාවක දී කිසිම මෝටර් ට්‍රයිසිකල් රියදුරකු විසින්, සාධාරණ හේතුවක් නොමැතිව, මෝටර් ට්‍රයිසිකලයක කුලී කිරීම ප්‍රතික්ෂේප කරනු නොලැබිය යුතු ය.

(11) කොමසාරිස් ජනරාල්වරයා හෝ බලයලත් නිලධරයකු විසින් යම් කුලීරථ මීටරයක් භාවිතා කිරීම තහනම් කිරීමේ නියමයක් නිකුත් කර ඇත්නම් මෝටර් ට්‍රයිසිකලයක අයිතිකරුවකු විසින් කුලීරථ මීටරය භාවිතා නොකළ යුතු අතර, එවැනි අවස්ථාවකදී, වහාම මෝටර් ට්‍රයිසිකලයෙන් කුලීරථ මීටරය ඉවත් කරනු ලැබිය යුතු ය. අනුමත කුලීරථ මීටරයක් නැවත සවිකරනු ලබනතෙක්, එවැනි මෝටර් ට්‍රයිසිකලයක අයිතිකරු විසින් එවැනි මෝටර් ට්‍රයිසිකලයක් කුලී රථයක් ලෙස යොදා ගැනීමෙන් ඉවත් කර ගත යුතු ය.

16. (1) කුලීරථ මීටරයේ ප්‍රමිතිය පිළිබඳ අනුමැතිය ලබාගැනීම සඳහා වූ සෑම ඉල්ලීමක් ම කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එවැනි සෑම ඉල්ලීමක් ම සමග පහත සඳහන් දේ ඉදිරිපත් කළ යුතු ය ː-

(අ) කුලීරථ මීටරයේ සම්පූර්ණ ආදර්ශක දෙකක්,

(ආ) නිෂ්පාදනය සහ නිෂ්පාදිත රට,

(ඇ) යන්ත්‍රයේ රූප සටහන් ද සමග එම කුලීරථ මීටරයේ සවිස්තර සටහනක්,

(ඈ) මිනුම් ඒකක සහ ප්‍රමිති සේවා දෙපාර්තමේන්තුව විසින් හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් බලය ලබා දුන් වෙනත් යම් රාජ්‍ය ආයතනයක් විසින් නිකුත් කරනු ලබන සහතිකය,

(ඉ) සපයන ලෙස ලිඛිතව කොමසාරිස් ජනරාල්වරයා හෝ වෙනත් යම් බලයලත් නිලධරයකු විසින් විධාන කරනු ලබන වෙනත් යම් අයිතම.

(2) අනුමැතිය අපේක්ෂා කරනු ලබන සෑම කුලීරථ මීටරයක් ම එම කුලීරථ මීටරය තාක්ෂණික නියමයන්ට අනුකූල වන්නේ ද යන්න දැනගැනීම සඳහා සම්පූර්ණ පරීක්ෂණයකට යටත් කරනු ලැබිය යුතු ය. සම්පූර්ණ පරීක්ෂා කිරීමක් සිදු කිරීම සඳහා පරීක්ෂණ නිලධරයා හට ආදර්ශක එකක් හෝ දෙකම විවෘත කර ගලවා බලනු ලැබිය හැකි ය. මෙම ගලවා බැලීමේ දී හෝ පරීක්ෂා කිරීමේ දී සිදුවන අලාභහානි සඳහා කොමසාරිස් ජනරාල්වරයා හෝ බලයලත් නිලධරයා වගකියනු නොලැබේ.

(3) එම කුලීරථ මීටරය ක්‍රියාත්මක කිරීම පිළිබඳ හුරුපුරුදු යම් තැනැත්තකු මගින් කුලීරථ මීටරය ක්‍රියාත්මක වීම පිළිබඳව පෙන්වා දෙන ලෙස කොමසාරිස් ජනරාල්වරයා හෝ පරීක්ෂණ නිලධරයා විසින් විධාන කිරීමේ දී ඉල්ලුම්කරු විසින් ඒ සඳහා කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(4) කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලබන ආකාරයේ කුලීරථ මීටරයක් සවි කරන ලද මෝටර් ට්‍රයිසිකලයත එවැනි ප්‍රායෝගික පරීක්ෂණයක කාර්ය සඳහා යටත් පිරිසෙයින් එක් දිනක් හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් ලිඛිතව දක්වනු ලබන යම් කාලයක් හෝ ඉල්ලුම්කරු විසින් ලබාදිය යුතු ය.

(5) එසේ සකස් කරනු ලබන සෑම කුලීරථ මීටරයක් ම -

(අ) එහි මුහුණත මත කාලය සහ දුර අනුව ගණනය කරනු ලබන ගාස්තු මුදල යෝග්‍ය ස්ථානයක ප්‍රදර්ශනය වන පරිදි, සහ

(ආ) කුලීරථ මීටරය ක්‍රියාත්මක වේ ද නැද්ද යන්න පිළිබඳ පෙන්නුම් කරනු ලබන සංඥාවක් කුලීරථ මීටරය මත ප්‍රදර්ශනය වන පරිදි,

සකස් වී තිබිය යුතු ය.

(6) (අ) මුහුණත මත දිස්වන අක්ෂර සහ ඉලක්කම් කුලීකරුට පහසුවෙන් කියවාගත හැකිවන පරිදි සාධාරණ ප්‍රමාණයකින් ස්ථානගත කර තිබිය යුතු ය ; සහ

(ආ) කුලීරථ මීටරයේ සහ එහි පාදකය මත වූ එම අක්ෂර සහ ඉලක්කම් ග්‍රාහකයා විසින් පහසුවෙන් කියවිය හැකි ප්‍රමාණයෙන් සහ වර්ණවලින් සමන්විත විය යුතු ය.

(7) යම් පළාතක යම් මාර්ගයක කුලී කරනු ලබන මෝටර් ට්‍රයිසිකලයක් සඳහා වූ උපරිම ගාස්තුව ප්‍රතිපත්තියක් මත හෝ මිල සූත්‍රය අනුව කළ ගණනය කිරීම් මත ගාස්තු සමාලෝචන කමිටුව විසින් තීරණය කරනු ලබන සහ ප්‍රකාශයට පත්කරනු ලබන මුදලක් විය යුතු ය.

17. ගාස්තු සමාලෝචන කමිටුව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය. -

(අ) කමිටුවේ සභාපතිවරයා විය යුතු ප්‍රවාහන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා,

(ආ) එම අමාත්‍යාංශය විසින් නම් කරනු ලබන මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයකු,

(ඇ) එම අමාත්‍යාංශය විසින් නම් කරනු ලබන පළාත් සභා අමාත්‍යාංශයේ නියෝජිතයකු,

(ඈ) ජාතික ප්‍රවාහන කොමිෂන් සභාව විසින් නම් කරනු ලබන එම කොමිෂන් සභාවේ නියෝජිතයකු,

(ඉ) පොලිස්පතිවරයා විසින් නම් කරනු ලබන ශ්‍රී ලංකා පොලිසියේ නියෝජිතයකු,

(ඊ) පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා විසින් නම් කරනු ලබන පළාත් පාලන දෙපාර්තමේන්තුවේ නියෝජිතයකු,

(උ) පාරිභෝගික ආරක්ෂණ අධිකාරිය විසින් නම් කරනු ලබන එම අධිකාරියේ නියෝජිතයකු ; සහ

(ඌ) අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන මහජන ප්‍රවාහන ක්ෂේත්‍රය පිළිබඳ පුළුල් දැනුමක්, අත්දැකීම් සහ සුදුසුකම් සහිත තැනැත්තන් විය යුතු නියෝජිතයන් දෙදෙනෙකු.

(2) (උ෴) ඡේදය යටතේ පත්කරනු ලබන ගාස්තු සමාලෝචන කමිටුවේ සෑම සාමාජිකයකු ම කලින් ධූරය හිස් කරනු ලබයි නම් හෝ අමාත්‍යවරයා විසින් ධූරයෙන් ඉවත් කරනු ලබයි නම් මිස, අවුරුදු තුනක කාලයක් සඳහා ධූර දැරිය යුතු ය. එවැනි යම් සාමාජිකයකු නැවත පත්වීම සඳහා යෝග්‍ය විය යුතු ය.

18. (1) මිල සූත්‍රයක් සකස්කර ප්‍රවාහන අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගැනීම ගාස්තු සමාලෝචන කමිටුවේ කාර්යය විය යුතුය.

(2) මිල සූත්‍රයට පහත සඳහන් කරුණු ඇතුලත් විය යුතු ය -

(අ) කිලෝමීටර් එකක් දුර ගමනක් හෝ එහි යම් කොටසක් සඳහා වූ ගාස්තුව ;

(ආ) පළමු කිලේමීටරය සඳහා වූ ගාස්තුව සහ කිලෝමීටර් එකකට වඩා වැඩි ගමනක සෑම අතිරේක කිලෝමීටරයක් සඳහා වූ ගාස්තුව ; සහ

(ඇ) රඳවාගෙන සිටින කාලසීමාව සඳහා වූ අයකිරීම.

(3) රඳවාගෙන සිටින කාලසීමාව සඳහා වූ අයකිරීම, රඳවාගෙන සිටින කාලසීමාව සඳහා වූ මිල සූත්‍රයක් අනුව කළ ගණනය කිරීම මත හෝ ප්‍රතිපත්තිය මත පදනම්ව ගාස්තු සමාලෝචන කමිටුව විසින් තීරණය කර ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය.

(4) රඳවාගෙන සිටීමේ කාලසීමාව යනු මෝටර් ට්‍රයිසිකලය ගමන් ආරම්භ කළ කාලයේ සිට ගමන අවසන් කළ කාලය අතරතුර ගමන් නොකරමින් සිටි සම්පූර්ණ කාලසීමාව විය යුතු ය.

(5) මෝටර් ට්‍රයිසිකලය ගමන් ආරම්භ කළ ස්ථානය ලෙස මගියාගේ ඉල්ලීම පරිදි මගියා එක් කරගනු ලැබූ ගරාජය, හෝ ප්‍රසිද්ධ නැවතුම හෝ ප්‍රසිද්ධ නැවතුම් නොවන වෙනත් ස්ථානයක් සලකනු ලැබිය යුතු ය. ගමනාත්තය යනු මගියා විසින් මෝටර් ට්‍රයිසිකලය මුදා හරිනු ලබන අවසාන ගමනාන්තය හෝ වේලාව වන්නේ ය.

(6) මගියකුගේ අතෙහි ගෙනයන සුරතල් සතුන් වැනි යම් ඕනෑම ආකාරයක අතිරේක දේපලක් ගෙනයාම සඳහා සාමාන්‍ය ගාස්තුව ඉක්මවන ආකාරයේ මුදලක් අයකරනු නොලැබිය යුතු ය.

(7) ගාස්තු සමාලෝචන කමිටුව විසින් අවශ්‍ය යැයි දක්වන ඕනෑම අවස්ථාවක දී අයකිරීම් ගාස්තු සහ රඳවා ගැනීමේ කාලසීමාව සඳහා වූ ගාස්තු ප්‍රතිශෝධනය කරනු ලැබිය යුතු ය.

(8) සභාපතිවරයා විසින් අවම වශයෙන් මාස හයකට වරක් හෝ ඔහු විසින් අවශ්‍ය බවට සලකනු ලබන අවස්ථාවකදී හෝ ගාස්තු සමාලෝචන කමිටු රැස්වීම කැඳවනු ලැබිය යුතු ය.

එසේ වුවද, ගාස්තු සමාලෝචන කමිටුවේ සාමාජිකයන් හතරදෙනෙකුට නොඅඩු සාමාජිකයන් විසින් රැස්වීමක් කැඳවන ලෙස සභාපතිවරයාගෙන් ලිඛිතව ඉල්ලා සිටින ඕනෑම අවස්ථාවක දී, සභාපතිවරයා විසින් රැස්වීමක් කැඳවනු ලැබිය යුතු ය.

(9) ගාස්තු සමාලෝචන කමිටුවේ කටයුතු සිදුකිරීම සඳහා අදාළ පරිචය සංග්‍රහය, ගාස්තු සමාලෝචන කමිටුවේ රැස්වීම්වලදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සහ ගාස්තු හා රැඳවුම් ගාස්තු සමාලෝචනය කිරීම සඳහා වූ මිල සූත්‍රය ආදිය ප්‍රවාහන අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබිය යුතු ය. ගාස්තු සමාලෝචන කමිටුව සිය කාර්ය පටිපාටිය ක්‍රමවත් කරන්නා වූ එවැනි යම් පරිචය සංග්‍රහයකට යටත් විය යුතු ය.

19. මේ නියෝගවල පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස -

"මෝටර් ට්‍රයිසිකලය" යන්නෙන් රෝද තුනක් මත ගමන් කිරීම සඳහා නිර්මාණය කර ඇති තාරබර කිලෝග්‍රෑම් 500 ක් නොඉක්මවන සහ මගීන් ගෙනයාම සඳහා පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් නිපදවා ඇති මෝටර් ට්‍රයිසිකලයක් අදහස් වේ.

08-564

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.